# දුද්ද ජාතකය

තවද ශාක්‍යකුල ක්‍රිටවූ සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි උපාසකවරුන් කීපදෙනෙකු සමගව දුන් දානයක් අරභයා මේ ජාතකය දක්වන ලද. ඒ කෙසේදැයි ආරාධිත වූ සර්වඥයන් වහන්සේ ඉකුත්වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරණ සමයෙහි බෝධිසත්වයන් වහන්සේ බ්‍රාහ්මණකුලයක ඉපිද වැටි විය පැමිණ පඤ්චකාමයෙහි ආදීනව දැක ප්‍රව්‍රජ්‍යායෙහි අනුසස් දැක පැවිදිව බොහෝ බොහෝ තාපසවරුන් පිරිවරා හිමාල වනයෙහි වාසය කරණසේක. වස් වසන අවධියට බරණැස් නුවර එක් උපාසකයෙක් බොහෝ දෙනා ලබා ගෙණ සත්දවසක් බොහෝතාපසවරුන්ට දන්දින, දන්දී අවසානයෙහිදී නායකව දන්දෙන උපාසක කියන්නේ ස්වාමීනි යන්තමක දන් දුන්නොත් ඇත බොහෝව දන්දුන්නොත් ඇත පින් එකසරියේ වෙදැයි කිහ. තාපසයෝ කියන්නේ ඒ එසේමය, ස්වල්පවුවත් බොහෝවුවත් දුන්නා වූ දානයෙහි විපාක බුදු පසේබුදු මහරහතුන් විසින් ප්‍රසංසාකරණ ලද. එසේ විසින් දානයෙහි විපාක කියාගත නොහැක්කේය. දානවිෂයෙහි මදදෙයක් දුන්නත් දිව්‍යලෝක සම්පත් විඳිනාහ. මේ මනාවූ දානය දීමෙන් කිම්දැයි සිතා දන් නුදුන්නොත් නරකාදීවූ දුක්විඳිනාහයි කියා වස් සාරමස ඒ ගම රඳා වස් අන්තයෙහි හිමාලය වනයට වැඩ සතර බ්‍රහ්මවිහරණයෙන් දවස්යවා නොපිරිහුනාවූ ධ්‍යානයෙන් බ්‍රහ්මලෝකප්‍රාප්ත වූහයි වදාරා දුද්දා ජාතකය නිමවා වදාළසේක. එසමයෙහි තාපසවරු නම් දැන් බුදුපිරිසය ගණජෝෂටව උපන්නෙම් බුදුවූ මම්මයයි වදාලසේක.